# ජ.වි. පෙරමුණේ මාක්ස්වාදී බොරු කකුල

පසුගියදා බර්ලිනයේ දී පැවැත්වූ ඊනියා සාම සාකච්ඡා හෙවත් ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ දී උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිට ජීවත්වන දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්න විසඳීම සඳහා ඒ ඒ පළාත්වල කමිටු පිහිටුවීමට තීරණය කර ඇත. මේ අප සැමදාමත් කියා සිටි කරුණක් තහවුරු වීමකි. දෙමළ ජනයාගේ ඇතැයි කියන ප්‍රශ්නය විසඳීම සඳහා උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම පාලනයක් (සන්ධීය, සහසන්ධීය හෝ වෙනත්) දීමෙන් ඒ පළාත්වලින් පිට සිටින දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නය නොවිසඳෙන බව අපි පෙන්වා දුන්නෙමු. එබැවින්ම මේ විසඳන්නට යන්නේ බොරු ප්‍රශ්නයක් බවද දෙමළ ජාතිවාදීන්ගේ ප්‍රශ්න නම් සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම බවද අපි කීවෙමු. උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම පාලනයක් දීමෙන් දෙමළ ජනයාට ඇතැයි කී ප්‍රශ්න නොවිසඳෙන බැවින් දැන් ඔවුහු අනෙක් පළාත්වල දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නය ගැන කතා කරති. සිංහලයන්ගේ නායකයන් ලෙස බ්‍රිතානීන් පත්කළ ද්‍රෝහීන් ලවා තව තවත් බටහිරයන්ගේ අනුග්‍රහයෙන් සිංහලත්වයට හිමි දෑ අහිමි කිරීම මෙහි අරමුණ වෙයි.

ජනතා විමුක්ති පෙරමුණ ද පසුගියදා දෙමළ ජනයාට ඇති ප්‍රශ්න ගැන කතා කර තිබුණි. මේ ප්‍රශ්න කවරේදැයි එහි නායකයන්ට කිව හැකිද? දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම පමණක් මෙරට ඇති ප්‍රශ්න කවරේද? වතුකරයේ දෙමළ කම්කරුවන්ගේ දුප්පත්කම මෙහිදී සඳහන් කළ නොහැකිය. ඔවුන් දුප්පත් නිසා ප්‍රශ්න ඇතිවී තිබෙන්නේ ඔවුන්ගේ දෙමළකම නිසා නොවේ. වතුවල වැඩ කරන ඇතැම් සිංහල කම්කරුවන්ට අඩු තරමින් නිල නිවාසවත් නැත. ඇතැම් සිංහල කම්කරුවෝ දෙමළ කම්කරුවන්ට වඩා ප්‍රශ්නවලට මුහුණ දෙති. යම් අයුරකින් වතුවල වැඩකරන බහුතරය සිංහල වී නම් එවිට දුප්පත්කම නැති වී යන්නේ නොවේ. අසූ තුනේ හෝ පනස් හයේ දී හෝ දෙමළ ජනයාට තාඩන පීඩන එල්ල වූයේ ඔවුන් දෙමළ වීම නිසා නොවේදැයි පණ්ඩිතයකු ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. එය දිගින් දිගට පවතින තත්ත්වයක් නොවේ. සිංහල දෙමළ හෝ වෙනත් එවැනි ගැටුමක් පවතින අවස්ථාවක සිදුවන ක්‍රියා දෙමළ ජනයා දෙමළ වීම නිසා ඇති ප්‍රශ්න යැයි හඳුන්වා දිය නොහැකිය. 1956 දී පමණක් නොව ඊට පසුව බොහෝ අවස්ථාවල ද එවැනි ගැටුම්වල දී සිංහලයෝ ද සිංහල වීම නිසා පමණක් තාඩන පීඩනවලට ලක් වූහ. එවැනි ගැටුම්වල දී එලෙස පහර දීම්වලට ලක්වන්නෝ දෙමළ ජනයා පමණක් නොවෙති. සිංහල දෙමළ මුස්ලිම් සියල්ලෝ ම තාඩන පීඩනවලට ලක්වෙති. කොටි ත්‍රස්තවාදීන් ගම්මානවලට පැන සිංහල දරුවන් පවා මරා දැම්මේ එලෙස මැරුම් කැවුන් සිංහල වීම නිසා ම බව අමතක නොකළ යුතුය. කොටි ඇතැම් අවස්ථාවල මුස්ලිම් ජනයා ඝාතනය කර ඇත්තේ ද ඔවුන් මුස්ලිම් වීම නිසාය. එබැවින් එවැනි ගැටුම් දෙමළ ජනයාට දෙමළ වීම නිසාම ඇති ප්‍රශ්නයක් ලෙස ගෙනහැර දැක්විය නොහැකි ය. එහෙත් අද සිංහලයන්ට සිංහලයන් වීම නිසා ම අහිමි වී ඇති දෑ වෙයි. අද යාපන අර්ධද්වීපයේ සිංහලයන් පදිංචි වී නැත. සිංහලයෝ ඒ ප්‍රදේශයෙන් ජනවාර්ගික වශයෙන් අතුගා දමනු ලැබුවෝ ය. අද යාපනයට සිංහලයන්ට පදිංචියට යෑමට නොහැක්කේ ඔවුන් සිංහලයන් වීම නිසාය. උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ගේ නිජභූමි වශයෙන් ඉන්දු ලංකා ගිවිසුමෙන් නොපිළිගැනෙයි. ඉන්දු ලංකා ගිවිසුමේ සඳහන් වන්නේ නිජභූමි නොව ඊනියා ඓතිහාසික වාසභූමි යැයි පණ්ඩිතයකු කීමට ඉඩ ඇත. එහෙත් අද වන විට ඊනියා ඓතිහාසික වාසභූමිය, නිජභූමිය, බවට පත්වී ඇත. ලංකාවේ පළාත් දෙකක් පමණක් ජනවර්ගයකගේ නිජභූමිය බවට පත්වන විට සිංහල ජාතියට සිංහල වීම නිසා ම ඒ පළාත් දෙක අහිමි වෙයි. ඒ පළාත් පැරැණි සිංහල රාජධානියෙහි රජ රටට හා රුහුණු රටට අයත්ව තිබූ බව සලකන විට සිංහලයන් කෙසේ පාවා දෙනු ලැබ ඇත්දැයි සිතාගත හැකිය.

අද මෙරට පොලිස්පති, නීතිපති දෙමළ ජනවර්ගයට අයත් වෙති. තවත් නිලතල රැසක දෙමළ ජනයා දැක ගත හැකිය. ඔවුන්ට දෙමළ වීම නිසා ඒ තනතුරු අහිමි වී නැත. විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුල්කිරීමේ දී අවුරුදු තුනක් පමණ මාධ්‍ය සම්බන්ධයෙන් ලකුණු ප්‍රමිත කිරීම නිසා දෙමළ සිසුන්ට මහා අසාධාරණයක් වී යැයි කෑ කෝ ගැසිණි. අද ද යම් කිසි ලකුණු ප්‍රමිත කිරීමක් සිදු වෙයි. ඒ විෂය සම්බන්ධයෙනි. ඒ ගැන සොයා බැලීමට පාර්ලිමේන්තු කමිටුවක් ද පත් කර ඇත. එහි ද අසාධාරණකම් වන බව ඇතැම්හු කියති. ඇතැමුන්ට අනුව ප්‍රමිතිකරණය නිසා මෙතෙක් සිදු වූ යම් අසාධාරණකම් නැති වී ඇත එපරිදි ම මාධ්‍ය සම්බන්ධයෙන් කෙරුණු ප්‍රමිතිකරණය හේතුකොටගෙන එතෙක් සිදු වූ අසාධාරණකම් නැති විණි. යැයි පැවසෙයි. ලකුණු ප්‍රමිතිකරණයෙන් දෙමළ වීම නිසාම දෙමළ සිසුන්ට එදා අසාධාරණයක් සිදු විණි යැයි කිව හැකි නොවේ. මාධ්‍ය සම්බන්ධයෙන් මෙන්ම විෂය සම්බන්ධයෙන් ද ලකුණු ප්‍රමිති

© Prof. Nalin De Silva

කිරීම නොකළ යුත්තක් නොවේ. එය මැනවින් අධ්‍යයනය කර කළ යුත්තකි. ඒ නිසා දෙමළ සිසුන්ට අසාධාරණයක් එදා සිදුවී යැයි යම් කිසිවකු පවසන්නේ නම් එදා අවුරුදු තුනකට පමණක් එලෙස ලකුණු ප්‍රමිති කිරීමට පෙර හා පසුව සිංහල සිසුන්ට සිංහල වීම නිසාම අසාධාරණයක් සිදු වී ඇතැයි කිව හැකිය. මේ පදනමක් නැති තර්කය. මාධ්‍ය සම්බන්ධයෙන් හෝ විෂය සම්බන්ධයෙන් හෝ ලකුණු ප්‍රමිති කිරීම කළ යුතු නම් දෙමළ සිසුන්ට හෝ වෙනත් අයට හෝ ඊනියා අසාධාරණයක් වන්නේ යැයි කියමින් ඒ අත්හැරිය යුතු නොවේ.

සිංහල භාෂාව මෙරට එකම රාජ්‍ය භාෂාව වීම නිසා දෙමළ ජනයා දෙවැනි පංතියේ පුරවැසියන් වී ඇතැයි යමකු කියන්නේ නම්, එවැන්නකුට අනුව ලංකාව හැර ලෝකයේ අන් සියලු රටවල පදිංචි දෙමළ ජනයා දෙවැනි පුරවැසියෝ වෙති. අද ලංකාවේ දෙමළ ද රාජ්‍ය භාෂාවක් වෙයි. ලංකාව හැර වෙනත් කිසිම රටක අද වන විට දෙමළ රාජ්‍ය භාෂාවක් නොවේ. එසේ නම් දෙමළ ජාතිවාදීන්ගේ තර්කය අනුව ඉන්දියාවේ දෙමළ ජනයා අති විශාල ප්‍රමාණයක් ජීවත් වුණ ද එහි දෙමළ රාජ්‍ය භාෂාවක් නොවීම නිසා ඒ ජනයා ඉන්දියාවේ දෙවැනි පංතියේ පුරවැසියෝ වෙති. සිංහලය පමණක් ලංකාවේ රාජ්‍ය භාෂාව වීම නිසා දෙමළ ජනයාට වන හානිය කුමක් ද? දෙමළ ජනයා යම් ප්‍රමාණයක් සිටින ප්‍රදේශවල රජය හා සම්බන්ධ වැඩ දෙමළෙන් කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම හැරෙන්නට කළ යුත්තේ කුමක්ද? අනෙක් අතට සිංහල පමණක් මෙරට රාජ්‍ය භාෂාව නොවීම නිසා සිංහලයට සිදුවන හානිය ඉමහත් ය. සිංහලය අවුරුදු දෙදහසක් පමණ කාලයක් මෙරට රාජ්‍ය භාෂාව වී තිබුණි. එය එසේ නොවූයේ බිරිතානීන් මෙරට පාලනය කළ සමයෙහිය. එබැවින් ඊනියා නිදහස ලැබූ ඉංගිරිසිය වෙනුවට සිංහලය රාජ්‍ය භාෂාව කළ යුතුව තිබුණි. එහෙත් පෙත්සම් මගින් ඊනියා නිදහසක් ලබාගත් ඉංගිරිසීන් විසින් පත්කරනු ලැබූ නායකයෝ ඉංගිරිසියම තව දුරටත් රාජ්‍ය භාෂාව ලෙස යොදා ගත්හ.

1956 සිංහලය පමණක් රාජ්‍ය භාෂාව බවට පත්කෙරුණ ද, අද ද මෙරට රජයේ වැඩකටයුතු බොහොමයක් කෙරෙන්නේ ඉංගිරිසියෙනි. ඉංගිරිසීන් විසින් පත්කෙරුණු නායකයන්ට හා දෙමළ ජාතිවාදීන්ට අවශ්‍ය සිංහලත්වයට මෙරට හිමි තැන අහිමි කිරීම ය. මෙරට ඇති ප්‍රශ්නය සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම මිස දෙමළ ජනයාට ඇති ඊනියා දුක් ගැනවිලි හෝ ඔවුන්ට කෙරී ඇති ඊනියා අසාධාරණකම හෝ නොවේ. ඉංගිරිසියෙන් අධ්‍යාපනය දීමට තාරා ද මැල් මහත්මිය ඇතුළු පිරිසක් කෑ මොර ගසති. අවුරුදු සියයකට වැඩි කාලයක් තිස්සේ ඉංගිරිසියෙන් අධ්‍යාපනය ලැබූ අයගෙන් බිහි වී ඇති ප්‍රවාද හා සංකල්ප කවරේ ද මේ ඊනියා අධ්‍යාපන විශේෂඥයන් නොදැන සිටියද බටහිර නූතනත්වයට පදනම දැමීමේ දී රෝම අධිරාජ්‍යයේ භාෂාව වූ ලතින් වෙනුවට යුරෝපීයයෝ ඒ ඒ රටවල ජාතික භාෂාවලින් කටයුතු කළහ. ගැලීලියෝ විද්වතා ලතින් අත්හැර ඉතාලි භාෂාවෙන් කටයුතු කළේය. නිව්ටන් පඬිවරයා තම ප්‍රින්සිපියා මැතමැටිකා කෘතිය ලතින් බසින් පළ කළ ද සාමාන්‍යයෙන් ඉංගිරිසි බස යොදා ගත්තේය. ඉංගිරිසිය අද පවත්නා තත්ත්වයට නැංවීමට ප්‍රධාන වශයෙන් දායක වූ ශේක්ස්පියර් පඬිතුමා ඉපදුනේ ගැලීලියෝ විද්වතා උපන් වසරෙහි මය. ඒ යුගයේ බටහිර යුරෝපීය ඉතිහාසය හදාරන විට පෙනීයන කරුණ නම් බටහිර යුරෝපයේ ජාතිකත්වය ඇතිවීමය. (වැඩි විස්තර සඳහා විදුසර ලිපි පෙළ කියවන්න) අද වන විට ඇංග්ලො සැක්සන් යටත්විජිතවාදයේ නිල භාෂාව ලෙස ඇමරිකන් ඉංගිරිය ඉදිරියට පැමිණ ඇත. ඒ බසින් කටයුතු කිරීමෙන් අපට තව තවත් අනුකාරක ඇංකරයන් හා ඇංකරියන් බිහිකර ගත හැකිය. තාරා ද මැල් මහත්මිය ඇංකරියක වූ පමණින් ඇය අනෙක් අය ද ඇංකරයන් කිරීමට දඟලන්නේ වල්ගය නැති කර ගත් නරියා (ඒ නරිච්චියක දැයි දැන ගැනීමට ක්‍රමයක් නැත) සිහි ගන්වමිනි.

ජනතා විමුක්ති පෙරමුණ විටින් විට බහුබූත දොඩවන්නේ ඔවුන්ගෙ මාක්ස්වාදී ඇදහිලි හේතුකොටගෙන ය. මාක්ස්වාදයෙන් ගැලවෙනතාක් ජනතා විමුක්ති පෙරමුණට මෙරට බලයට ඒමට නොහැකි වනු ඇත. අද ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දෙන්නේ දෙමළ හෝ මුස්ලිම් හෝ ජනයාට වඩා සිංහලයන්ය. මැතිවරණවලදී ජනතා විමුක්ති පෙරමුණ ලබාගන්නා ඡන්දවල සිංහල ප්‍රතිශතය රටේ සිංහල ප්‍රතිශතයට වඩා බෙහෙවින් වැඩිය. වර්තමානයෙහි ජනතා විමුක්ති පෙරමුණ සිංහලත්වයට හිමි තැන නැවත ලබා දීමට කටයුතු නොකරන බව සිංහල ජනතාව දන්නේ නම් ඒ පක්ෂය ලබා ගන්නා ඡන්ද ප්‍රමාණයට එය බලපානු ඇත.මාක්ස්වාදය යනු යල් පැන ගිය දැනුම් පද්ධතියකි. බටහිර භෞතික විද්‍යාව වැනි විෂයක් නම් එය මේ වන විට කෙව්ටකින් ඉවත ලන ගැරඬි හැවක් මෙන් විසිකර දමා හමාරය. මාක්ස්වාදයෙහි අනාවැකි සත්‍යය වී නොමැත. එයට ලෝකය තේරුම් ගත හැකි නොවේ. මෙරට මාක්ස්වාදය කර තබාගෙන සිටින බොහෝ දෙනා මාක්ස්වාදය විද්‍යාත්මක යැයි කියන්නේ ඔවුන් දන්නා හෝ

අසා තිබෙන විද්‍යාව පිළිබඳ දර්ශනයක් ගැන සිතමිනි. මේ බොහෝ දෙනා බටහිර විද්‍යාව යනු කුමක්ද කියාවත් නොදනිති. බටහිර විද්‍යාව හදාරා ඇති ඔස්මන්ඩ් ජයරත්න, කාලෝ ෆොන්සේකා ආදී මහත්වරු පවා අයින්ස්ටයින්ගේ සාධාරණ සාපේක්ෂතාවාදය හෝ ක්වොන්ටම් භෞතිකය හෝ නොදන්නා බව මට සාක්ෂි ඇතිව පෙන්වා දිය හැකිය. මේ බොහෝ දෙනාට හතළිස් ගණන්වලින් පසු බටහිරම ඇතිවූ දැනුම ගැන වුවද ඒතරම් අවබෝධයක් නැති වීම කනගාටුවට කරුණකි. ජයරත්න මහතා කෙතරම් හොඳ මිත්‍රයකු වුවද ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය ගැන කණගාටු වන අතර මා කිව යුත්තේ අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදයෙන් නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය බැහැර කෙරී (වර්ධනය කෙරී නොව) ඇති බව හෝ ඔහු නොදන්නා බවය. විද්‍යාවක් ගැන කතා කරන සුචරිත ගම්ලත් මහතා දන්නා විද්‍යාවක් නැත. මොවුන්ගේ දැනුම හඳුනාගැනීම සඳහා අවශ්‍ය නම් සම්මන්ත්‍රණයක් කැලණිය විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් තැනක හෝ සංවිධානය කළ හැකිය. ගම්ලත් මහතා බටහිර විද්‍යාව ගැන මෙලෝ හසරක් නොදන්නා නමුත් එහි දර්ශනය ගැන අතනින් මෙතනින් අහුලා ගත් කෑලි යොදා ගනිමින් හුදී ජනයාට කරුණු පහදයි. බටහිර විද්‍යාවේ අද ඇති වී තිබෙන ප්‍රශ්නවලට ඊනියා භෞතිකවාදී පිළිතුරු ලෙනින් දී ඇතැයි මොවුහු සිතා ගෙන සිටිති. ලෙනින් පිළිතුරු දී ඇතැයි කියන අර්නස්ට් මාක් නැගූ ප්‍රශ්න හෝ වෙනත් බටහිරයකු අද නගන ප්‍රශ්න ගැන හෝ නොව අප නගන ප්‍රශ්නවලට පිළිතුරු දීමට කිසිම මාක්ස්වාදියකුට නොහැකිය. ඉරිදා දිවයින හැර වෙනත් පුවත්පත්වලට වී පාළු ගෙවන්වල වළං නොබිඳ අපද සහභාගි වන ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක දී අප නගන ප්‍රශ්නවලට පිළිතුරු සපයන මෙන් අභියෝග කරමි. කාලෝ ෆොන්සේකා මහතා වැන්නන් තේරුම් නොගන්නා දෙයක් නම් අප විඥානවාදීන් හෝ භවසන්තානමාත්‍රවාදීන් (සොලිපසිස්ට) හෝ නොවන බවය. අපේ දර්ශනයෙහි එනම් නිර්මාණාත්මක පාපේක්ෂතාවාදයෙහි මනසද නිර්මාණයකි. මේ මහත්වරුන්ටත් මාක්ස්වාදය පිළිගන්නා ජනතා විමුක්ති පෙරමුණේ නායකයන්ටත් හැකි නම් මනසින් තොරව ඊනියා වාස්තවික යථාර්ථයක් ඇති බව මනසින් තොරව පෙන්වන මෙන් ඉල්ලමි. ඊනියා වාස්තවික යථාර්ථයද මනසේ නිර්මාණයකි. කාලෝ ෆොන්සේකා මහතා නොදැන සිටිය ද අපේ දර්ශනයෙහි මනසද මනසෙහි නිර්මාණයක් වෙයි. ඒ මහතාටත් අනෙක් අයටත් එය එසේ වන්නේ කෙසේද යන වග මා සිංහල බෞද්ධ මනස යන මැයෙන් ඉරිදා දිවයින පුවත්පතට ලියූ ලිපිය කියවීමෙන් දැනගත හැකිය. මෙරට බොහෝ උගතුන් (මාක්ස්වාදී ඕල්කට් බෞද්ධ ආදී) සිටින නමුදු ඔවුහු එවැනි ලිපිවලට අඩුම තරමින් අභියෝගයක් හෝ නොකරති. අභියෝග කිරීමට තරම් දෙයක් ඒ ලිපිවල නැතැයි කියමින් ප්‍රශ්නයෙන් පැන යෑම නම් සුදුසු ක්‍රියාවක් නොවේ.

මාක්ස්වාදය යනු අද බටහිර යටත්විජිතවාදීන්ගේ ප්‍රධාන අවියක් වෙයි. එය බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි ම කොටසක් වෙයි. බටහිර නූතනත්වයේ ම නිර්මාණයක් වූ මාක්ස්වාදය යොදා ගෙන බටහිර නූතනත්වය හා ඒ ඇසුරින් පැන නැගි බටහිර යටත්විජිතවාදයට හා දණවාදයට එරෙහි ව සටනේ කළ හැකි නොවේ බටහිරින් දැනුම එනතුරු කට ඇරගෙන බලා නොසිට අපි අපේ දැනුම් නිර්මාණය කිරීමට වෙහෙස ගත යුතු වෙමු. ජනතා විමුක්ති පෙරමුණට යා හැකි ගමනක් වෙයි. එහෙත් මාක්ස්වාදී බොරු කකුල් මත සිටගෙන ඒ ගමන යා නොහැකිය. සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමට විරුද්ධ සටනේ පෙරමුණ ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් නොවන්නේ නම් සිංහලයන් ඉදිරි කාලයේ දී සුදුසු ක්‍රියාමාර්ගයක් ගනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva